**ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය**

**කොළඹ**

*****

**<u>පුවත්පත් නිවේදනය</u>**

**<u>ඉන්දියාවේ උපාධි, පශ්චාත් උපාධි සහ පර්යේෂණ/ආචාර්ය උපාධි හැදෑරීම සඳහා ශිෂ්‍යත්ව</u>**

ඉන්දියානු රජය විසින් ලබා දෙනු ලබන පහත දැක්වෙන ශිෂ්‍යත්ව සඳහා අයදුම් කළ හැකි අවසාන දිනය 2021 මැයි 15 දක්වා දීර්ඝ කර ඇත. කලින් අයදුම් කිරීම සඳහා අවසාන දිනය වූ 2021 අප්‍රේල් 20 වන දිනට පෙර අයදුම් කළ නොහැකි වූ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට 2021 මැයි 15 වන දිනට පෙර අයදුම් කළ හැකිය. 1) **නේරු අනුස්මරණ ශිෂ්‍යත්ව වැඩසටහන:** මෙම වැඩසටහන මගින් ඉංජිනේරු, විද්‍යා, ව්‍යාපාර, ආර්ථික විද්‍යාව, වාණිජ, මානව ශාස්ත්‍ර සහ කලා ඇතුළු සියලුම (වෛද්‍ය/පරිපූරක වෛද්‍ය සහ විලාසිතා නිර්මාණකරණ පාඨමාලා හැර) <u>උපාධි පාඨමාලා</u> ආවරණය කෙරේ. 2) **රජීව් ගාන්ධි ශිෂ්‍යත්ව වැඩසටහන:** B.E හෝ B.Tech උපාධියක් දක්වා යොමු වන තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ <u>උපාධි පාඨමාලා</u> මෙයට ඇතුළත් වේ. 3) **මවුලානා අසාද් ශිෂ්‍යත්ව වැඩසටහන:** මෙම වැඩසටහන මගින් ඉංජිනේරු, විද්‍යා, ව්‍යාපාර, ආර්ථික විද්‍යාව, වාණිජ, මානව ශාස්ත්‍ර සහ කලා ඇතුළු සියලුම (වෛද්‍ය/පරිපූරක වෛද්‍ය සහ විලාසිතා නිර්මාණකරණ පාඨමාලා හැර) <u>ශාස්ත්‍රපති උපාධි පාඨමාලා (Masters)</u> ආවරණය කෙරේ. කෙසේ වෙතත්, ඉංජිනේරු, විද්‍යා සහ කෘෂිකර්මය යනාදි අංශයන්ට ප්‍රමුඛත්වය දෙනු ඇත. 4) **පොදු රාජ්‍ය මණ්ඩලීය ශිෂ්‍යත්ව වැඩසටහන:** වෛද්‍ය/පරිපූරක වෛද්‍ය සහ විලාසිතා නිර්මාණකරණ පාඨමාලා හැර සියලු විෂයන්හි <u>ආචාර්ය උපාධි</u> මෙම වැඩසටහන මගින් ආවරණය කෙරේ.

2. අවශ්‍ය විස්තර අධ්‍යාපන අමාත්‍යාංශයීය වෙබ් අඩවිය වන **www.mohe.gov.lk** තුළින් ලබා ගත හැකිය. මෙම උපාධි පාඨමාලා සඳහා

අයදුම් කිරීමට සපුරා තිබිය යුතු සුදුසුකම් හා තෝරාගැනීමේ ක්‍රමවේදය පිළිබඳ වැඩිදුර විස්තර දැන ගැනීම සඳහා ශ්‍රී ලංකාවේ අධ්‍යාපන අමාත්‍යාංශය හෝ කොළඹ පිහිටි ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය හා සම්බන්ධ වන ලෙස උනන්දුවක් දක්වන සිසුන් වෙත දන්වනු ලැබේ.

***

**කොළඹ**
**2021 අප්‍රේල් 23**